සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

15741

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 6 | විෂයය / பாடம் / Subject : සිංහල භාෂාව හා සාහිත්‍යය. | පත්‍රය / வினாத்தாள் / Paper : I,II | කාලය / காலம் / Time : පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I - කොටස

- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප අර්ථ දෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) නරියා සුදානම් වන්නේ කුකුළා ඩැහැගැනීමට ය.
(1) අල්ලා ගැනීමට (2) සපා කෑමට (3) ගිල ගැනීමට (4) උදුරා ගැනීමට

(02) අපට කරන්නට තියෙන්නේ දිය තියෙන රටකට සේන්දු වීමටයි.
(1) ගමන් කිරීමට (2) ළඟාවීමට (3)දුරස්වීමට (4) පැමිණීමට

- පහත සඳහන් වචනවලට සමානාර්ථ දෙන වචනය පිළිතුරු අතරින් තෝරන්න.

(03) සුළඟ - (1) සිසිල (2) වදුල (3) මාරුතය (4) කුණාටුව
(04) දිළිඳු - (1)බිලිඳු (2) දිනිඳු (3) පොහොසත් (4) දුප්පත්

- පහත සඳහන් වචනවලට විරුද්ධාර්ථ දෙන වචනය පිළිතුරු අතරින් තෝරන්න.

(05) නිශ්චල - (1) නිසොල්මන් (2) නිශ්ශබ්ද (3) චංචල (4) සන්සුන්
(06) ආගන්තුක - (1) විදේශික (2) නේවාසික (3) ස්වදේශික (4) පෞද්ගලික

- පහත සඳහන් වගන්තිවල යොදා ඇති විරාම ලක්ෂණ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(07) කිව්වා මතක ද?
(1) ප්‍රශ්නාර්ථ ලකුණ (2) විස්මයාදී ලකුණ (3) පෙරළි කොමා (4) තනි උඩු කොමා

(08) සැප වේවා !
(1) පෙරළි කොමා (2) විස්මයාදී ලකුණ (3) ප්‍රශ්නාර්ථ ලකුණ (4) තනි උඩු කොමා

- 09, 10 යන ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(09) (1) චායා රූපය (2) වර්ගඵලය (3) ප්‍රථිපත්තිය (4) විශේශ
(10) (1) ආවේණික (2) සංරක්ශන (3) පිළිවෙල (4) කොන්ඩය

◆ පහත සඳහන් වාක්‍ය දෙකෙහි ඉරි ඇඳි පදවල අර්ථය නිවැරදි ව දැක්වෙන පද, වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(අ) කුඩුවේ සිරවී, සරණක් නැතිව සිටි කුරුල්ලා අහසේ සරන කුරුල්ලකු දෙස බලා දුක්වනු ඇතැ යි ළමයාට සිතුණි.

(ආ) පැලට ගිය ගොවියා ගොයම් පැළ පීදී තිබෙනු දැක සතුටු විය.

(11) සරණක් - ( 1. පිහිට 2. හැසිරෙන)

(12) සරන - ( 1. පිහිට 2. හැසිරෙන)

(13) පැලට - ( 1. කුඩා නිවස 2. කුඩා ගස)

(14) පැළ - ( 1. කුඩා නිවස 2. කුඩා ගස)

◆ පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(15) (රජවරුන් / රජවරු) ........................................ මහ වැව් තැනූහ.

(16) (ළමයා / ළමයි) ........................................ බයිසිකල් පදිති.

(17) (මම / මා) .................................... ඔවුන් ඇමතුවෙමි.

(18) මව දරුවන් .................................. (රකින්නීය. / රැක්කෝය.)

(19) ගංගා මුහුදට ගලා ............................ (බසී. / බසින්නෝය.)

(20) ගොවියෝ ........................................ දක්කති. ( ගවයන් / ගවයෝ)

(මුළු ලකුණු 2 × 20 = 40)

## II කොටස

● 1 සහ 2 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

(01) පන්ති කාමරයේ දී ඇගයීමක් ලෙස ඔබ නිර්මාණය කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබේ කණ්ඩායම නිර්මාණය කළ බිත්ති පුවත්පත සඳහා යෙදූ නම කුමක් ද? (ලකුණු 02)

(ii) එම බිත්ති පුවත්පත නිර්මාණයේ දී ඔබට පැවරුණු කාර්යය කුමක් ද? (ලකුණු 02)

(iii) බිත්ති පුවත්පතට ඇතුළත් කළ ලිපි දෙකක මාතෘකා සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා තොරතුරු රැස් කරගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 04)

(v) මෙවැනි බිත්ති පුවත්පතක් සකස් කිරීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 125 කට නො අඩු රචනයක් ලියන්න.

(i) අසිරිමත් මව්බිම

(ii) විදුලිය අපතේ නො යවමු

(iii) එකමුතු ව ජීවත්වීමේ වටිනාකම

(iv) සාරධර්මවල අගය

(v) ගසක් කතා කරයි (ලකුණු 14)

(03) ඔබ පාසලේ පැවැත්වුණු තෑගි දීමේ උත්සවය ගැන විස්තර කරමින් වෙනත් පාසලකට අස් වී ගිය මිතුරකුට ලිපියක් ලියන්න.

(ලකුණු 10)

(04) පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න.

(අ) ''ඇටි කෙහෙල් කනවා තියා ඒවා ගැන හිතන්න වත් එපා''

(i) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද? (ලකුණු 01)

(ii) මෙසේ කීවේ කා හට ද? (ලකුණු 01)

(iii) මෙසේ කියන ලද්දේ කුමන අවස්ථාවේ දී ද? (ලකුණු 02)

(iv) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න. (ලකුණු 01)

(ආ) ''මා මෙතන සිටින්නේ නොහඳුනන අවිශ්වාස අයගේ ගමන නතර කිරීමට ය. ඔබ කවු ද?''

(i) මෙම ප්‍රකාශය කළේ කවු ද? (ලකුණු 01)

(ii) මෙසේ කීවේ කා හට ද? (ලකුණු 01)

(iii) මෙසේ කීවේ කුමන අවස්ථාවේ දී ද? (ලකුණු 02)

(iv) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 10)

(05) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සහරාව අප්‍රිකාවේ පිහිටි මහා කාන්තාරයකි. එයට ස්වල්ප වූ ද වර්ෂාවක් ලැබෙනුයේ කලාතුරකිනි. දහවල් කල එහි අධික උෂ්ණත්වයක් පවතින නමුත් රාත්‍රිය අතිශයින් ම ශීතල ය.

මේ කාන්තාරය තනිකර වැල්ලෙන් වැසුණු සමතලා බිමක් හැටියට බොහෝ දෙනා කල්පනා කරති. එහෙත් එය වැරදි අදහසකි. එහි භූමිය අතිශයින් ම විෂම ය.ඇතැම් තැන්හි කඳු හා උස් සම බිම් ද් ඇත්තේ ය. තව සමහර තැනක වියළී ගිය ගංගා පවා දක්නට ලැබේ. වැල්ලෙන් වැසී ඇත්තේ සහරාවෙන් පහෙන් කොටසක් පමණකි.

මේ කාන්තාරය මධ්‍යයෙහි ජලය ලබා ගත හැකි සාරවත් ප්‍රදේශ ද ඇත්තේ ය. ඒවාට ක්ෂේම භූමි යයි කියනු ලැබේ. මේ ක්ෂේම භූමිවල දහස් ගණන් අශ්ව, ඔටු, ගව, බැටළු ආදී සත්තු ද ඇති කරනු ලබති.

(i) සහරාව යනු කුමක් ද?

(ii) එය පිහිටියේ කොහේ ද?

(iii) ක්ෂේම භූමියක් යනු කුමක් ද? හඳුන්වන්න.

(iv) ඡේදයට අනුව සහරාවේ කාලගුණය ගැන දැක්වෙන කරුණු දෙකක් ලියන්න.

(v) නිරතුරු, සම යන පදවලට විරුද්ධ පද ඡේදයෙන් සොයා ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

(06) පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වැඩක නොයෙදූ සිත
නරක අතට ම පෙරළෙත
කිමෙක වන යහපත
වැඩක එබැවින් යොදනු තම සිත

ඇඟ වැසුමෙන් නිසි ඇඳුම් අඳින්නේ
බඩ නෙරුමෙන් රෙදි ඇඳ නොම ගන්නේ
හිස වැසුමෙන් කිසි තැන නොවදින්නේ
සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ

අනුන්ට බුහුමන් දී සලකන්නේ
තමන්ට බුහුමන් ලැබෙයි එයින්නේ
අනුන්ට තම වංශය කියමින්නේ
ලබන්ට නම්බුව නොසිතාපන්නේ

(i) මෙම කවිවලින් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(ii) පළමු කවියට අනුව නරක අතට සිත පෙරළෙන්නේ කුමක් නිසා ද?

(iii) ඇඳුම් ඇඳීම පිළිබඳ ව දෙවැනි කවියෙන් කියැවෙන කරුණු දෙක දක්වන්න.

(iv) තෙවැනි කවියට අනුව තමන්ට බුහුමන් ලැබෙන්නේ කුමක් කිරීමෙන් ද?

(v) මෙම කවි පෙළ උපුටා ගෙන ඇත්තේ කුමන උපදේශාත්මක කෘතියෙන් ද?

(ලකුණු 2 × 5 = 10)

(07) (අ) පහත සඳහන් කවිවල අඩු පද සඳහා ගැළපෙන පද නිර්මාණය කොට ඒවා සම්පූර්ණ කරන්න.

(i) දරුවනි ලක්දිව උපන්න
හොඳ ගුණ දම් පුරුදු වන්න
ජාතික සිරිතට නැමෙන්න
..................................................

(ලකුණු 01)

(ii) හෝ හෝ ගා වහින වැස්ස
වලාකුළින් වැටෙන වැස්ස
..................................................
..................................................

(ලකුණු 02)

(iii) කඳු මුදුනින් ඇද හැලෙනා
..................................................
..................................................
..................................................

(ලකුණු 03)

(ආ) සම්පූර්ණ කවියක් නිර්මාණය කොට ලියන්න.
..................................................
..................................................
..................................................
..................................................

(ලකුණු 04)

(ලකුණු 10)

(මුළු ලකුණු 60)